ඔස්ට්‍රේලියාවේ අන්තිම කැමති පත්‍රයක් ලිවීමේ වැදගත්කම

ඔබ අන්තිම කැමති පත්‍රයක් ලියා තැබුවා ද?

සෑම කෙනෙකුටම ඔස්ට්‍රේලියාවේ ජීවත්වන්නේ නම් අන්තිම කැමති පත්‍රයක් අවශ්‍ය වේ. එය ඔබ ජීවත්ව සිටින කාලයේ අත්සන් කරනු ලබන ඉතා වැදගත්ම ලේඛනයක් ලෙස හැඳින්විය හැක. අන්තිම කැමති පත්‍රයක් ලියා තැබීමෙන් ඔබගේ බූදලය සම්බන්දයෙන් පැන නැගිය හැකි ආරවුල් වැලැක්වෙන අතර ඔබ වඩාත් ආදරය කරනු ලබන අයට එය ඉතා අස්වැසිල්ලක් වේ.

අන්තිම කැමති පත්‍ර පිලිබඳ හසල පල පුරුද්දක් ඇති අපගේ සොලිසිටර්වරුන් පැහැදිලිව හා නිවැරදිව ඔබගේ අන්තිම කැමති පත්‍රය ලිවීම තුලින් අනාගතයේ ඔබගේ බූදලය සම්බන්දයෙන් ඇතිවිය හැකි උරුමය පිළිබඳ ගැටළු හෝ අභියෝග ජය ගැනීමට හැකිවනු ඇත. එමගින් ඔබ මිය ගිය පසු උරුමය පිළිබඳ නඩු කටයුතු වලක්වා ගත හැක.

අන්තිම කැමති පත්‍රයක් ලිවීම තුලින් වෙනත් කාරනා වලට අමතරව පහත කරුනු ස්ථිරව ලියා තැබිය හැක.

- බූදලය කවුරු විසින් පරිපාලනය කළ යුතුද වග
- ඔබගේ දේපලේ උරුමය කාහට හිමිවිය යුතුද
- උරුමක්කරුවන්ට විශේෂ ත්‍යාග දීම
- බාළ වයස්කාර දරුවන්ගේ භාරකාරත්වය කාට දියයුතුද වග සහ
- දේහය පිළිබඳ අවසාන කටයුතු කෙලෙසක සිදුවිය යුතුද වග.

එසේ නම් වහාම අපගේ නීතිඥවරුන් හමුවන්න.  කල් නොදමන්න.